*සැ.යු.:* 2025.08.29 දින පළ කරන ලද අංක 2452 *ගැසට් පත්‍රයේ* III හා IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,553 - 2025 සැප්තැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් | — |
| අවසාන නියෝග | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | 308 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | 315 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් මස 26 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජූනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

307 - B 082716 - 353 (2025/09)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ලිහිණියා කුමාරගේ මධුෂ සංකල්ප වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ ආණ්ඩුකාරවරයා විසින් 1955.11.11 දින ප්‍රදානය කර ඇති අංක R 4495 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන වැලිපැන්න පදිංචි හෙට්ටි කංකානම්ගේ විල්ප්‍රඩ් ජේරා බුද්ධදාස මයා වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 03/67 යටතේ *දිනය අපැහැදිලියි* වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති ප්‍රදාන පත්‍රලාභියා මියගොස් ඇති බැවින් ඔහුගේ සහෝදරිය වන මේබල් ප්‍රභා රණතුංග මිය වෙත අංක LDOA01/42 යටතේ 2013.06.05 දින මුල් අයිතිය හිමි වී ඇති අතර ඇයත් මියගොස් ඇති බැවින් සහ පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩ පත්තුවේ/කෝරළේ, 794 ඒ හොරවල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හොරවල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේයර් ජනරාල් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පී. පී. ඒ. 353 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 83/85 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 4, පර්චස් 30 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම,

කැබලි අංක 83

*උතුරට* : ටී. පී. 275265,
*නැගෙනහිරට* : පී. පී. ඒ. 353 හි කැ. අ. 80, 81,
*දකුණට* : පී. පී. ඒ. 353 හි කැ. අ. 81, 52 (පාර),
*බස්නාහිරට* : පී. පී. ඒ. 353 හි කැ. අ. 52 (පාර)

කැබලි අංක 85

*උතුරට* : පී. පී. ඒ. 353 හි කැ. අ. 49, ටී. පී. 313270,
*නැගෙනහිරට* : පී. පී. ඒ. 353 හි කැ. අ. 52,
*දකුණට* : පී. පී. 135587 හි කැ. අ. 1 හා පී. පී. ඒ. 353 හි කැ. අ. 49,
*බස්නාහිරට* : පී. පී. ඒ. 353 හි කැ. අ. 49 හා පී. පී. 13587 හි කැ. අ. 1

එල්. කේ. මධුෂ සංකල්ප,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මතුගම.

2025 අප්‍රේල් මස 07 වැනි දින.

09 -08

---

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උමේෂා මාතරගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 ජුනි 21 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/5941 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන අකුරුගොඩ පදිංචි මුණසිංහ ආරච්චිගේ හින්නිහාමි වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L. D. O. 618 යටතේ 1986.03.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම පත්තුවේ/කෝරළේ අකුරුගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අකුරුගොඩ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, මාතර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක 0 24/15, 23, 24 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මාර 1040 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 0 24/15, 23, 24 දරන රේඛා සටහනේ අංක 55 දරන බිම් කැබැල්ල

වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර/ අක්කර 00, රූඩ් 01, පර්චස් 38 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද ගල්ඇන්දකුට්ටිය රජයේ ඉඩම.

*උතුරට* : මූ. පි. මාර 1040 හි 56 කැබැල්ල,
*නැගෙනහිරට* : මූ. පි. මාර 1040 හි 09 කැබැල්ල,
*දකුණට* : මූ. පි. මාර 1040 හි 54 කැබැල්ල,,
*බස්නාහිරට* : මූ. පි. මාර 1040 හි 49 කැබැල්ල.

උමේෂා මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2025 අප්‍රේල් මස 21 වැනි දින.

09 -09/1

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උමේෂා මාතරගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 ජුනි 21 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/5910 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන අකුරුගොඩ පදිංචි කුලීගොඩ පතිරණගේ මිසිනෝනා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L. D. O. 527 යටතේ 1991.08.22 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම පත්තුවේ/කෝරළේ අකුරුගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අකුරුගොඩ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, මාතර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 0 24/15, 23, 24 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මූ. පි. මාර 1040 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 0 24/15, 23, 24 දරන රේඛා සටහනේ අංක 14 1/2 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර/අක්කර 00, රූඩ් 01, පර්චස් 11 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද ගල්ඇන්දකුට්ටිය රජයේ ඉඩම.

*උතුරට* : මූ. පි. මාර 1040 හි 13 කැබැල්ල,
*නැගෙනහිරට* : මූ. පි. මාර 1040 හි 19 කැබැල්ල,
*දකුණට* : මූ. පි. මාර 1040 හි 14 2/2 කැබැල්ල,,
*බස්නාහිරට* : මූ. පි. මාර 1040 හි 09 කැබැල්ල.

උමේෂා මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2025 අප්‍රේල් මස 21 වැනි දින.

09 -09/2

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

ඌව පළාත් සභාවේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.06.24 දින ප්‍රදානය කර ඇති මො/ප්‍ර 20230 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන නුගේගලයාය, කිරිඉබ්බන්වැව පදිංචි සමරවික්‍රම ලියනගේ චන්ද්‍රාණි වෙත ප්‍රදානය කොට මොණරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/M25/31 යටතේ 1997.05.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිත්තරම් පළාත පත්තුව/කෝරළේ නුගේගලයාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුගේගලයාය, නැගෙනහිර නමැති ගමේ පිහිටා

ඇත්තා වූ ද, අංක 128 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.804 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : මාර්ගය හා කැබලි අංක 127,
*නැගෙනහිරට* : කැබලි අංක 127,
*දකුණට* : කැබලි අංක 175, 155, 156,
*බස්නාහිරට* : කැබලි අංක 155 සහ මාවත.

ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
සෙවනගල.

2025 මාර්තු මස 03 වැනි දින.

09 -10/1

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

ඌව පළාත් සභාවේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.01 දින ප්‍රදානය කර ඇති මො/ප්‍ර 9661 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන බඹිරාව, මිහිඳුගම පදිංචි එදිරිමාන්නගේ ඇඩ්වින් වෙත ප්‍රදානය කොට මොණරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/M8/62 යටතේ 1995.11.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිත්තරම් පළාත පත්තුව/කෝරළේ බඹිරාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බඹිරාව, මිහිඳුගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 692 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් 60 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 680 සහ 679,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය,
*දකුණට* : මාර්ග රක්ෂිතය,
*බස්නාහිරට* : කැබලි අංක 691.

ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
සෙවනගල.

2025 මාර්තු මස 10 වැනි දින.

09 -10/2

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

ඌව පළාත් සභාවේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.12.20 ප්‍රදානය කර ඇති මො/ප්‍ර 14821 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උස්වැලි ආර, සෙවනගල පදිංචි ගමරාලලාගේ ටිකිරි බංඩා වෙත ප්‍රදානය කොට මොණරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/M18/173 යටතේ 1996.10.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිත්තරම් පළාත පත්තුව කටුපිලගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උස්වැලිආර නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක F. T. P. 38 දරන රේඛා සටහනේ අංක 67 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් 60 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : සමාගම සතු ඉඩම් සහ මාර්ග රක්ෂිතය,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය,

*දකුණට* : කැබලි අංක 66,
*බස්නාහිරට* : සමාගම සතු ඉඩම්.

ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
සෙවනගල.

2025 පෙබරවාරි මස 13 වැනි දින.

09 -10/3

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

ඌව පළාත් සභාවේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.04.23 ප්‍රදානය කර ඇති මො/ප්‍ර 18843 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කොවුල් ආර, දකුණ පදිංචි බානගලගේ සාමෙල් වෙත ප්‍රදානය කොට මොණරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/M24/109 යටතේ 1997.05.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිත්තරම් පළාත පත්තුව/කෝරළේ කටුපිලගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුපිලගම, කොවුල් ආර දකුණ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 415 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් 60 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : ප්‍රවේශ මාර්ගය,
*නැගෙනහිරට* : ඉඩම් අංක 414,
*දකුණට* : ඇල රක්ෂිතය,
*බස්නාහිරට* : ප්‍රවේශ මාර්ගය සහ ඇල මාර්ගය.

ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
සෙවනගල.

2025 පෙබරවාරි මස 13 වැනි දින.

09 -10/4

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

ඌව පළාත් සභාවේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.10.14 ප්‍රදානය කර ඇති මො/ප්‍ර 26376 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නුගේගලයාය නැගෙනහිර පදිංචි ජාසිං ආරච්චිගේ හින්නිහාමි වෙත ප්‍රදානය කොට මොණරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/M75/133 යටතේ 2000.11.20 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිත්තරම් පළාත පත්තුව/කෝරළේ නුගේගලයාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුගේගලයාය, නැගෙනහිර නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 174 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.816 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 172, 173 සහ 864,
*නැගෙනහිරට* : කැබලි අංක 864 හා 175,

*දකුණට* : කැබලි අංක 175 හා මාර්ග රක්ෂිතය,
*බස්නාහිරට* : කැබලි අංක 173 හා මාර්ග රක්ෂිතය

ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
සෙවනගල.

2025 පෙබරවාරි මස 10 වැනි දින.

09 -11

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉන්දික රුවන් කුමාර විතාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986 මාර්තු මස 18 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/4062 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කටුවැව පදිංචි වලිමුනිගේ ලොකුහාමි වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1675 යටතේ 1987.05.12 දින ලියාපදිංචි කර ඇති පහත සඳහන් ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ බැදිගම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුවැව බැදිගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අ. ග. පි. 261 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 11 ජේ. ඕ. දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03 පර්චස් 34 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම: කොමේහේන.

*උතුරට* : ලොට් 11 ජේ. ඩී. දරන බිම් කැබැල්ල ද,
*නැගෙනහිරට* : ලොට් 11 ජේ. පී. දරන බිම් කැබැල්ල ද,
*දකුණට* : ලොට් 11 ජේ. වී. දරන බිම් කැබැල්ල ද,
*බස්නාහිරට* : ලොට් 11 ජේ. එන්. දරන බිම් කැබැල්ල ද වේ.

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2025 ජුනි මස 03 වැනි දින.

09 -21/1

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපලේඛනය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉන්දික රුවන් කුමාර විතාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1987 මාර්තු මස 23 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/5874 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කිංචිගුණේ පදිංචි ජයවික්‍රම කංකානම්ගේ කරෝලිස් වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 809 යටතේ 1988.04.06 දින ලියාපදිංචි කර ඇති පහත සඳහන් ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ කිංචිගුණේ දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්‍රාහ්මණයාගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අ. ග. පි. 377 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.728 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: ලෝලුගහහේන :

*උතුරට* : ලොට් 67 න් කොටසක් ද,
*නැගෙනහිරට* : ලොට් 15 ප්‍රවේශ මාර්ගය ද,
*දකුණට* : ලොට් 23 දරන ඉඩම් කැබැල්ල ද,
*බස්නාහිරට* : ලොට් 13 දරන ඉඩම් කැබැල්ල ද වේ.

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2025 ජූනි මස 24 වැනි දින.

09 -21/2

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වන්නිආරච්චි වනිගසේකර චින්තා පද්මිණි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.03.18 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/2/ප්‍ර/19300 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මාමඩල, හැඩවින්න ලිපිනයෙහි පදිංචි මුදලිගේ සිරිසේන යන අය වෙත ප්‍රදානය කොට ඇති පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ හැඩවින්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාමඩල නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 24 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 464 දරන පිඹුරෙහි කැබලි අංක 1243 හි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.202 ක විශාලත්වයෙන් යුත් හැඩවින්න යාය ලෙස හඳුන්වනු ලබන පහත පරිදි මායිම් වූ රජයේ ඉඩම් කොටස,

*උතුරට* : ලොට් 1242,
*නැගෙනහිරට* : ලොට් 1245 - 1246,
*දකුණට* : ලොට් 1252 2/2 ද,
*බස්නාහිරට* : ලොට් 56 - 1241 ද වේ.

චින්තා පී. ඩබ්. වන්නිආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2025 ජූනි මස 16 වැනි දින.

09 -21/3

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එරංගා මදුමාලි ගීගන ගමගේ මහානාම වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996 අගෝස්තු 06 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/5/ප්‍ර/37061 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 02, සුම්හිරිගම, මී ඇල්ල පදිංචි ඇල්ලවෙල පහලගේ විමලාවතී වෙත ප්‍රදානය කොට තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 3694 යටතේ 1997.09.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ සුම්හිරිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කණුමුල්දෙණිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද අ. ග. පි. 171 දරන පිඹුරෙහි ප්‍රමාණයෙන් රූඩ් 02, පර්චස් 02.4 විශාලත්වය ඇති, පහත පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : දොලේවත්ත.

*උතුරට* : ප්‍රවේශ මාර්ගය සහ ලොට් 100,
*නැගෙනහිරට* : ලොට් 05,

*දකුණට* : ලොට් 4, 3,
*බස්නාහිරට* : ලොට් 100, 3

එරංගා මහානාම,
ප්‍රාදේශීය ලේකම්,
ඕකෙවෙල.

2025 ජුනි මස 30 වැනි දින.

09 -21/4

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්-වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.14 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 26451 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 705, බෙරලිහෙල, තිස්සමහාරාම හි පදිංචි වෙඩින්පුලිගේ අන්ද්‍රයස් වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/95/2802/98 යටතේ 1998.07.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ/ කෝරළේ බෙරලිහෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඩා ගම්මාන 03 නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 48 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ. භූ. පි. 02 අංක 2228 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.211 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 2227,
*නැගෙනහිරට* : කැබලි අංක 2195,
*දකුණට* : කැබලි අංක 2231 හා 2230,
*බස්නාහිරට* : කැබලි අංක 2229 හා 2226.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2022 දෙසැම්බර් මස 13 වැනි දින.

09 -21/5

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.11.07 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 40374 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 705, කුඩා ගම් 03, වම් ඉවුර, පරාක්‍රමපුර, තිස්සමහාරාම හි පදිංචි වෙඩින්පුලිගේ අන්ද්‍රයස් වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/95/2939/98 යටතේ 1998.07.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ/ කෝරළේ පරාක්‍රමපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වම් ඉවුර - කුඩා ගම්මාන 03 නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති අංක 705 කුඹුර දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

*උතුරට* : 704 වගා ඉඩම හා අංක 57 කෙත් ඇළ,
*නැගෙනහිරට* : අංක 57 කෙත් ඇළ හා 706 දරන වගා ඉඩම,

*දකුණට* : 706 වගා ඉඩම හා බස්නා ඇල,
*බස්නාහිරට* : 704 වගා ඉඩම හා බස්නා ඇල.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2022 දෙසැම්බර් මස 10 වැනි දින.

09 -21/6

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාතේ, පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණවීර ආරච්චිගේ චතුරි දමිත්‍රා වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986 ජූලි 22 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/ 5170 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මුරුංගස්යාය පදිංචි අංගප්පුලිගේ පිලිප්පු වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1553 යටතේ 1987.05.12 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.26 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ/මුරුංගස්යාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුරුංගස්යාය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති අවසාන ගම් පිඹුරු අංක 401 දරන රේඛා සටහනේ අංක 367 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 26 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : ලොට් 339 දරන බිම් කැබැල්ල ද,
*නැගෙනහිරට* : ලොට් 400 දරන බිම් කැබැල්ලද,
*දකුණට* : ලොට් 368 සහ ලොට් 400 දරන බිම් කැබලි ද,
*බස්නාහිරට* : අ. ග. පි. 318 දරන බිම් කැබැල්ල ද වේ.

ආර්. ඒ. චතුරි දමිත්‍රා,
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2024 ජුනි මස 13 වැනි දින.

09 -21/7

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/79728
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංක : එන්සීපී/පීඑල්සී/එල්02/ මනුප/දීර්ඝ කාලීන*

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 294, අභය වැව ග්‍රාම නිලධාරි වසමේ, ලෝලුගස්වැව ගමේ න. මැ. මු. පි 14 බී හි කැබලි අංක 969 න් කොටසක් පෙන්වීම සඳහා ඉඩම් නිලධාරි එස්. ටී. මුතුගල මහතා විසින් සකස් කරන ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 11 ක් වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා ප්‍රදීපා ලක්සෙත පදනම භාරකාර මණ්ඩලය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

*උතුරට* : යෝධ ඇල රක්ෂිතය,
*නැගෙනහිරට* : යෝධ ඇල රක්ෂිතය,
*දකුණට* : යෝධ ඇල රක්ෂිතය හා කේ. ඒ. ආර්. කුමාරසිංහගේ ඉඩම,
*බටහිරට* : කේ. ඒ. ආර්. කුමාරසිංහගේ ඉඩම

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ (30) යි. (2025.07.25 දින සිට 2055.07.24 දක්වා);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම **සමිති කටයුතු සඳහා හැර** වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2025.07.25 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,<br>
සහකාර ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 අගෝස්තු 04 වැනි දින,<br>
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,<br>
"මිහිකත මැදුර",<br>
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -03

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/72512<br>
*ඉඩම් කොමසාරිස්ගේ අංකය : DO 02/MHY/LTL/85*

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 04, පහරගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාපාකඩවැව ගමේ අ. හූ. පි. 58 අතිරේක අංක 68 පත්‍ර අංක 409 පිඹුරේ හි කැබලි අංක 10088 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 7.8 ක් වූ ඉඩම් කොටස කෘෂි කාර්මික කටයුතු සඳහා නවරත්න මුදියන්සේලාගේ සංජීව ගයාන් නවරත්න නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : 722, 718 හා 10089, |
| *නැගෙනහිරට* | : 722, 721, |
| *දකුණට* | : 10089, |
| *බටහිරට* | : 722 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.07.23 දින සිට වසර 30ක් ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000.00) හෝ රුපියල් මිලියන පහට (රු. 5,000,000.00) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම **වාණිජ කටයුතු සඳහා හැර** වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2025.07.23 දින සිට අවුරුදු 05 ක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම් සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 අගෝස්තු මස 11 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -04

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/77032*
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/AL/LTL/06*

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 985 කන්දෙගෙදර උතුර ග්‍රාම නිලධාරි වසමේ, කන්දෙගෙදර ගමේ අ. ග. පි. 444 හි කැබලි අංක 643 න් කොටසක් දැක්වීම සඳහා කච්චේරි මානක ඒ. එච්. කේ. විජයතිලක මහතා විසින් මැන සැකසූ අනුරේඛන අංක 2019/30 හි කැබලි අංක A දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 10 ක් විශාල වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා සීමා රහිත පන්ගොල්ල සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 444 හි කැබලි අංක 643, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 444 හි කැබලි අංක 643, |
| *දකුණට* | : අ. ග. පි. 444 හි කැබලි අංක 643, |
| *බටහිරට* | : මාර්ගය |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ (30) යි. (2025.05.23 දින සිට 2055.05.22 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2025 වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම **වාණිජ කටයුතු මිස** වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත්

කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.05.23 දින සිට අවුරුදු 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 අගෝස්තු මස 11 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -05

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2025.09.04 | බ්‍රහස්පතින්දා | 2025.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.12 | සිකුරාදා | 2025.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.19 | සිකුරාදා | 2025.09.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.09.26 | සිකුරාදා | 2025.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | සිකුරාදා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.